# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.26 පැය 0830 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 841 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk | | |


**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. ද්විත්ව මනුෂ්‍ය ඝාතනයකට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මන්නාරම කඳවුර.**

2025.04.25 වන දින සවස් කාලයේ මන්නාරම පොලිස් වසමේ 02 කණුව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා මන්නාරම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර 2025.01.16 වන දින මන්නාරම අධිකරණය ඉදිරිපිට වෙඩි තබා ද්විත්ව මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමට අදාල සැකකරුවන් හට පලා යාමට ආධාර අනුබල දුන් බවට සැකකරනු ලබන පුද්ගලයෙකු යතුරුපැදියක් හා ජංගම දුරකතනයක් සමග අත්අඩංගුවට ගෙන මන්නාරම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 38 ක් වන කොට්ටවෙලි, මන්නාරම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මන්නාරම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුර.**

2025.04.25 වන දින සවස් කාලයේ හොරණ පොලිස් වසමේ ගුරුගොඩ හන්දිය ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර නීති විරෝධී මත්පැන් ලීටර් 19 මිලි ලීටර් 500 ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන හොරණ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 50 ක් වන ගුරුගොඩ, පෝරුවදණ්ඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හොරණ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. නීති විරෝධි මත්පැන් හා ගෝඩා සමග සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වව්නතිව් කඳවුර.**

2025.04.25 වන දින උදෑසන කාලයේ වව්නතිව් පොලිස් වසමේ පෙරියකාලපෝට්ටමඩු ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා වව්නතිව් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර, නීති විරෝධි මත්පැන් ලීටර් 37ක්, නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා

ගෝඩා ලීටර් 50 ක්, බැරල් 01 හා තඹ දඟර 01 ක් සමග සැකකරුවෙකුද, නීති විරෝධි මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 300 ක් හා බැරල් 02 ක් සමග සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන වව්නතිව් පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරුවන් අවුරුදු 18 සහ 37 යන වයස්වල පසුවන කන්නන්කුඩා ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

වව්නතිව් පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. නීති විරෝධි ලෙස පතල් කැණීම් කරන ලද සැකකරුවෙකු අත්අඩංගුවට - බුත්තල පොලිස් විශේෂ කායර් බලකා කඳවුර.

2025.04.25 වන දින දහවල් කාලයේ බඩල්කුඹුර පොලිස් වසමේ වෙහෙරගොඩ ප්‍රදේශයේදී බුත්තල පොලිස් විශේෂ කායර් බලකා කඳවුරේ නිලධාරින් කණ්ඩායමක් සහ මොණරාගල ජාතික මැණික් හා ස්වණර්ාභරණ අධිකාරියේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර නීති විරෝධි ලෙස පතල් කැණීම් කළ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මොණරාගල ජාතික මැණික් හා ස්වණර්ාභරණ අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 42 ක් වන බඩල්කුඹුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොණරාගල ජාතික මැණික් හා ස්වණර්ාභරණ අධිකාරිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. කේරළ ගංජා සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කායර් බලකා කිලිනොච්චිය කඳවුර.

2025.04.26 වන දින දහවල් කාලයේ ධමර්පුරම් පොලිස් වසමේ පිරිනන්දන්නාරු ප්‍රදේශයේදී පොලිස් විශේෂ කායර් බලකා කිලිනොච්චිය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **කේරළ ගංජා කිලෝ 20 ග්‍රෑම් 10 ක්** සමග සැකකාරියක් අත්අඩංගුවට ගෙන ධමර්පුරම් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකාරිය වයස අවුරුදු 55 ක් වන පිරිනන්දන්නාරු ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ධමර්පුරම් පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**